**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව - 2022**

**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාව විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ආකෘතිය භාවිතා කර නොතිබුණි. | නීති ආධාර කොමිෂන් සභාව 2022 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පෙර වර්ෂවල ආකෘතිය අනුව පිළියෙල කළ බවත්, ඉදිරි වර්ෂවලදී එය නිවැරදි ආකෘතියට අනුකූලව පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි සඳහන් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ ආකෘතිය ප්‍රකාරව දේපළ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය වෙනම පෙන්විය යුතු වුවද, 2022 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 03 හි ප්‍රත්‍යාගණන අතිරික්තය වන රු.1,550,000 ක වටිනාකම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු කරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කළ යුතු වුවත්, කොමිෂන් සභාවේ 2021 | උපකරණ ප්‍රත්‍යාගණනය සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවන බැවින්, ප්‍රත්‍යාගණන කටයුතු සඳහා දැරීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීම හේතුවෙන් මෙය සිදු කිරීම පිළිබඳ ගැටලුවක් ඇති බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් රු.31,822,859 ක් වටිනා පරිගණක, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ යන වත්කම් සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් පමණක් තිබෙන දේපළ, පිරියත හා උපකරණ අයිතම සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් 2022 දෙසැම්බර් 31 දිනට මෝටර් වාහන හැර රු.92,137,572 ක් වටිනා අනෙකුත් දේපළ, පිරියත හා උපකරණ ආසන්න වර්ෂ 05 ක් තුළ දී ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | උපකරණ ප්‍රත්‍යාගණනය සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවන බැවින්, ප්‍රත්‍යාගණන කටයුතු සඳහා දැරීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීම හේතුවෙන් මෙය සිදු කිරීම පිළිබඳ ගැටලුවක් ඇති බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, රු.1,220,000 ක් වූ මෝටර් වාහන 03 ක් පමණක් රු.1,550,000 ක වටිනාකමකට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර, රු.950,000 ක් පිරිවැය වූ වාහන 02 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන (Revalue) කටයුතු සිදු කරනු ලබන්නේ වසර පහකට වරක් වන අතර. ත්‍රීරෝද රථ ප්‍රත්‍යාගණනය සිදු කර ඇත්තේ 2018 වර්ෂයේදී බවත් එය නැවත ප්‍රත්‍යාගණනය කරනුයේ 2023 වර්ෂයේදී බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි ඡේද 44 ප්‍රකාරව රජය විසින් සිදු කරනු ලබන ප්‍රදානයන් වත්කම් සහ අයභාර ලෙස හඳුනාගත යුතු වුව ද, රු.7,300,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් මෙම ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂවල මෙම ගැටලු නිරාකරණය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 80 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තාකරණ දිනෙන් මාස 12 ක් තුළ නිරවුල් කිරීමට නියමිත වගකීම් ජංගම වගකීම් ලෙස හඳුනා ගනු ලැබිය යුතු වුව | ඉදිරි වර්ෂවල මෙම ගැටලු නිරාකරණය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ජංගම වගකීම් නිවැරදිව හඳුනාගත |

| | | |
|---|---|---|
| ද, පාරිතෝෂිත වෙන්කිරීම් වලට අදාළ සමස්ත වටිනාකම වන රු.82,528,824 ක් ජංගම නොවන වගකීම් ලෙස පමණක් හඳුනා ගැනීමට කටයුතු කර තිබුණි. | | යුතු ය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයේ ගණනය කිරීම් අනුව වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොළී ආදායම හා ලැබිය යුතු පොළී ආදායම පිළිවෙලින් රු. 533,292 ක් හා රු. 357,079 ක් වුවද, එය පිළිවෙලින් රු. 767,312 ක් හා රු.399,989 ක් ලෙස ගිණුම්වලට ගෙන තිබීම හේතුවෙන් වර්ෂයේ පොළී ආදායම රු. 234,020 ක් වැඩියෙන් ද, ලැබිය යුතු පොළී ආදායම රු.42,910 ක් වැඩියෙන් ද ගිණුම්වල දක්වා තිබුණි. | පෙර වර්ෂයන්හිදී පෙන්නුම් කළ ආකාරයටම 2022 වර්ෂයේද මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය පෙන්වන ලද බව දන්වා තිබුණි. | ස්ථාවර තැන්පතු පොළී ආදායම් මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව දැක්විය යුතු ය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 15,656,035 | මිලදී ගැනීමට අදාළ වවුචර්, තක්සේරු වාර්තා | 2009 වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීමේදී, එහි ආරම්භක ශේෂයන් ලෙස 2009 වර්ෂයට පෙර වර්ෂවල කොමිෂමේ ප්‍රධාන කාර්යාලයට හා ශාඛාවන් සඳහා මිලදීගත් පරිගණක, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ යන ස්ථාවර වත්කම් මිලදීගැනීම් වන අතර, මෙම තොරතුරු ලබාගනු ලැබුයේ ඒ ඒ වර්ෂවල මුදල් පොත පාදක කරගෙන වන අතර ඒ ඒ වර්ෂවල මෙම සටහන් විගණනයද සිදු කරන ලද බව දන්වා තිබුණි. | ස්ථාවර වත්කම්වලට අදාළ ශේෂ තහවුරු කර ගැනීමට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු ය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ සේවය කළ නිලධාරිනියක විදේශ ගත වී වසර 5 ක් ගතව ඇතත්, නැවත සේවයට වාර්තා කර නොතිබූ අතර, ගිවිසුම් කොන්දේසි කඩ කිරීම හේතුවෙන් අයකරගත යුතු රු.220,251 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම නිලධාරිනිය වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇති බව දන්වා තිබුණි. | ගිවිසුම අනුව ගෙවිය යුතු මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | කළුතර, බිබිල හා මීගමුව යන මධ්‍යස්ථානවල ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා රු.1,217,830 ක් වූ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී වර්ෂ 01 ත් වර්ෂ 04 ත් අතර කාලයක් ගත වී තිබුණ ද එම අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බිබිල සහ මීගමු මධ්‍යස්ථානවල අලුත්වැඩියා සිදුකර අවසන් අතර ඒ සඳහා ලබා දුන් අත්තිකාරම්, 2023 අප්‍රේල් 29 දින පියවා ඇති අතර, කළුතර මධ්‍යස්ථානය අලුත්වැඩියාව කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය මගින් අත්තිකාරම් ලබා දී තිබූ බැවින් අධිකරණ අමාත්‍යාංශයට ලිපියක් මඟින් දැනුම් දී ඇති බව දන්වා තිබුණි. | අත්තිකාරම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | රාජ්‍ය බැංකු තුළ ආයෝජනය කර තිබූ රු.7,447,775 ක් වූ ස්ථාවර තැන්පතු සඳහා අදාළ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොමිෂන් සභාවේ සේවකයින් සේවයෙන් ඉවත් වීමේදී ගෙවීමට සිදුවන Gratuity සඳහා මුදල් නොමැති වීම හේතුවෙන් වර්ෂයක් සඳහා රුපියල් දෙලක්ෂ පනස්දහසක් වැනි මුදලක් Gratuity Provision සඳහා 2021 වර්ෂය දක්වා වෙන් කිරීමක් සිදු කරන ලදී. නමුත් 2022 වර්ෂයේදී එසේ සිදු නොකරන ලදී. හේතුව මුදල් නොමැති වීම සහ රජයේ චක්‍රලේඛ අනුව වියදම් අඩු කිරීමට කටයුතු කිරීම හේතුවෙන් බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 395 (ඌ) | මුදල් රෙගුලාසිවලට පටහැනිව මුදල් පොත පවත්වාගෙන යනු ලබන නිලධාරියා විසින්ම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි. | කොමිෂමේ පවතින පුරප්පාඩු හේතුවෙන් මෙය සිදුවී ඇති අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) 2020 අගෝස්තු 18 දිනැති අංක 01/2020 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1(ආ) වගන්තිය | අවස්ථා 21 ක දී ලබා දුන් රු.815,225 ක් වටිනා අත්තිකාරම් පියවීමේදී චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කර නොතිබුණි. | රටේ පවතින තත්ත්වයන් හා අනිකුත් සාධක මත වැඩසටහන් දිනය වෙනස්වන අවස්ථා පවතින අතර, බොහෝ අවස්ථාවල අත්තිකාරම් පියවීමේ ඉතිරි මුදල අප වෙත ලැබෙනුයේ තැපැල් මාර්ගිකව බැවින් ඒවායේ පවතින බෙදා හැරීම් ප්‍රමාද වීම හේතුවෙන් වැඩසටහන් පියවීම් වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙනුයේ ප්‍රමාද වී බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 315 (1), 880 | ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොමිෂමේ නිලධාරීන් විශ්‍රාම වැටුපට හිමිකම් නොකියන නිලධාරීන් වේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (පොදු ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ) ඡේද අංක 2.3 හි උපලේඛන I හි ඡේද අංක 01 | කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශය පරිදි උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 – 2029 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්ම සකස් කරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,906,980 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,754,042 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,847,062 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ කොමිෂමේ රජයේ ප්‍රධාන රු.26,787,690 කින් ද, ආධුනික ශිෂ්‍යයන්ගේ වැඩසටහන්වලින් ලද ආදායම රු.1,208,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ 2022 කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව නීති ආධාර සැපයීම සඳහා 2022 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාව 38,099 ක් වූ අතර, 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අලුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 11,380 ක් වූයෙන් එම කාල සීමාව තුළ කටයුතු කිරීමට තිබූ මුළු නඩු සංඛ්‍යාව 49,479 ක් විය. ඉන් නඩු 10,740 ක් දෙසැම්බර් 31 දක්වා නිරවුල් කිරීමට කටයුතු කර තිබුණු අතර, එදිනට තවදුරටත් නිරවුල් කිරීමට තිබූ නඩු 38,739 ක් විය. එය මුළු සේවා සැපයීමට තිබූ නඩු සංඛ්‍යාවෙන් සියයට 78 ක් විය. | පිළිතුරු සපයා නොතිබුණි. | පනතේ අරමුණු ප්‍රකාරව කාර්ය සාධනය පවත්වා ගත යුතු ය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (නීති) හා අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) යන ප්‍රධාන තනතුරු තුන සඳහා ද, ‘‘කළමනාකරණ’’ සේවා ගණයට අයත් නීති නිලධාරි තනතුරු 29 ක ද පුරප්පාඩු පැවතුණි. | අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2022 නොවැම්බර් සිට පුරප්පාඩු වූ අතර රාජකාරී ආවරණය කිරීම සඳහා කොමිෂන් සභාවේ පරිපාලක පත්කර ඇත. සෙසු තනතුරු දෙක අභ්‍යන්තර තනතුරු වේ. ඊට සුදුසුකම් සපුරා ඇති අයවලුන් නොමැති බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. මෙම ගැටලු විසඳමින් විධිමත්ව ආයතනය පවත්වාගෙන යාමට ගැලපෙන පරිදි බඳවා ගැනීමේ පරිපාටිය නැවත සංශෝධනය කිරීමටද පියවර ගන්නා බව දන්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු ය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති පීඊඩී අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය පරිදි 2022 වාර්ෂික වාර්තාව 2023 සැප්තැම්බර් 11 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | - | චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කළ යුතු ය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ 2022 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණකවරයෙකු ද පත්කර නොතිබුණි. | මීට පෙර සෑම වර්ෂයකම කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණනය අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරන අතර කොමිෂමේ, බඳවා ගැනීමේ පරිපාටිය අනුව අභ්‍යන්තර විගණන තනතුරක් නොමැති අතර කෙසේ වෙතත් බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමේදී මෙම තනතුර ඇතුළත් කිරීමට පියවර ගන්නා බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (පොදු ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය) ඡේද අංක 2.3 හි උපලේඛන I හි ඡේද අංක 03 මාර්ගෝපදේශය පරිදි අයවැය ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 නොවැම්බර් 16 දිනැති චක්‍රලේඛය නිකුත් වීමට පෙර එනම්, 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනය 2021 ජුනි 30 දිනට පෙර රේඛීය අමාත්‍යාංශය වන අධිකරණ අමාත්‍යාංශය වෙත යැවීමට අධිකරණ අමාත්‍යාංශයෙන් එවන ලද ආකෘතිය අනුව පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |